# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1652/09 – 2010 මැයි 03 වැනි සඳුදා – 2010.05.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: රප්‍රා/22/එල්/ඒ/7253 (2).
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: 3ජේ/73/එල්ජී/584.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, මුද්දුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 1998.01.09 දිනැති අංක අ.ග.පි. 80 පත්‍රය 41, අතිරේකය 41 දරන පිඹුරේ කැබලි අංක 879 වශයෙන් දැක්වෙන "තෙල්වත්ත" නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1205 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංක 879**

ඉඩමේ නම: තෙල්වත්ත; හිමිකම් කියන අය: (1) කේ. වී. ලාල් ගමගේ, අංක 10/10, ක්‍රීඩාපිටිය පාර, මුද්දුව, රත්නපුර, (2) ජී. වී. පුංචිනිලමේ, ගැටන්ගම, රත්නපුර, (3) කේ. එම්. පුංචිනිලමේ, රන්තියතැන්න, මුද්දුව, රත්නපුර, (4) බී. එම්. සුගතපාල, පහලවත්ත, මුද්දුව, රත්නපුර; ප්‍රමාණය: හෙක්. 0.1205

**මායිම්:**

උතුරට: කළු ගඟ හා කැබලි අංක 880; නැගෙනහිරට: කැබලි අංක 880 හා ඇත් ඔය; දකුණට: ඇත් ඔය ඇළ; බටහිරට: ඇත් ඔය ඇළ සහ කළු ගඟ.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 ජුනි මස 23 වැනි දින ප.ව. 2.00 ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 ජුනි මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ජේ. එම්. දේවප්‍රිය විජයරාජ,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2010 අප්‍රේල් මස 30 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රත්නපුර.

05 - 362


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.